**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ණය අංක 2758-එස්ආර්අයි-එස්එෆ්) -2015**

-------------------------------------------------------------------------------------------------------------

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2015 ජනවාරි 01 දින සිට 2016 ජනවාරි 31 දිනෙන් අවසන් මාස 13 ක කාලසීමාව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ජූලි 22 දින එළඹි අංක 2758 එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------------------

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, නැගෙනහිර පළාතේ මූතූර් නාගරික ප්‍රදේශයේ 52,000 ක් වන ජනතාවට පිරිසිදු ජලය සැපයීම සහ ජල කටයුතු සම්බන්ධ ආයතන ශක්තිමත් කිරීම මගින් පිරිසුදු ජලය සැපයීමේ ධාරිතාවය වැඩි කිරීමයි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 17.87 කට සමාන රු.මිලියන1,942.47 ක් වන අතර එයින් එජඩො මිලියන 13.3 කට සමාන රු.මිලියන 1,445.71 ක් ආසියනු සංවර්ධන බංකුව විසින් මුල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් මූලිකව 2014 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කරන ලද අතර, පසුව මෙහි කාලය 2015 ජූලි 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, 2016 ජනවාරි 31 දක්වා මූල්‍ය ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2016 ජනවාරි 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වුයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශනයන්**

**2.1 මතය**

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ

(අ) 2016 ජනවාරි 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 ජනවාරි 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව:

**3. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය හා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2016 ජනවාරි 31 දිනෙන් අවසන් කාලසීමාව සඳහා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල** | | **සමාලෝචිත කාලසීමාව සඳහා අයවැයගත ප්‍රතිපාදනය** | **අරමුදල් උපයෝජනය** <br> **සමාලෝචිත කාලසීමාව** | **2016 ජනවාරි 31** | |
|---|---|---|---|---|---|---|
| | **එජඩො (මිලියන)** | **රු.(මිලියන)** | **රු.(මිලියන)** | **රු.(මිලියන)** | **එජඩො (මිලියන)** | **රු.(මිලියන)** |
| ආසබැ | 13.30 | 1,445.71 | NIL | 21 | 10.06 | 1,280 |
| ශ්‍රී ලංකා රජය | 4.57 | 496.76 | 5.86 | 59 | 3.68 | 435 |
| එකතුව | **17.87** | **1,942.47** | **5.86** | **80** | **13.74** | **1,715** |

ඉහත දක්වන ලද තොරතුරු අනුව, රු.මිලියන 1,445.70 කට සමාන එ.ජ.ඩො.මිලියන 13.30 ක් වූ මුළු වෙන් කිරීම් මුදලින් ව්‍යාපෘති ණය කාලසීමාව අවසන් දිනය වන 2016 ජනවාරි 31 දින වන විට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,280 කට සමාන එ.ජ.ඩො.මිලියන 10.06 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

------------------

ලැබී ඇති තොරතුරු අනුව, මුතූර්හි ප්‍රධාන ඉදිකිරීම්, මුතූර් පිරිසිදු නොකල ජල සම්ප්‍රේෂණය සහ පවිත්‍රාගාරය වැඩ නිම කල යුතු දිනයට වඩා මාස 11 ක් පමාවීමක් සහිතව 2014 වර්ෂයේ වැඩ නිම කර තිබූ අතර, පමා කාලසීමාව තුළ මිල ඉහළයාම නිසා රු.මිලියන 11.62 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. කෙසේ වුවද, 2016 ඔක්තෝබර් සිදුකරන ලද භෞතික පරික්ෂාවේදී මුතූර්හි ඉදිකරන ලද ජල රැඳවුම (intake) දැඩි ඛාදනයට නිරාවරණය වී ඇති අතර ඉදිකිරීම්වලට හානිවීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

### 3.3 මතභේදයට තුඩුදෙන වියදම්

-----------------------------

ව්‍යාපෘතිය විසින් ගෙවන ලද සමාලෝචිත වර්ෂය තුල අනෙකුත් ආධාර ව්‍යාපෘතිවල එකතුව රු.මිලියන 3.96 ක්වූ කාර්ය මණ්ඩල වැටුප් මෙම ව්‍යාපෘතියේ වියදම් ලෙස දක්වා තිබුණි.

### 3.4 මූල්‍ය පාලන දුර්වලතා

------------------------

මුදල් රෙගුලාසි 133 හා 2010 ජුලි 26 දිනැති අංක ඩීඑම්ඒ/2010 (5) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කර නොතිබුණි.

### 3.5 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම

--------------------------------------

2016 ජනවාරි 31 ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කර තිබුණද, ගිණුම් වසා දැමීමේ කටයුතු සිදුකිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වත්කම් පවරා දීමේ කාර්යයන් සඳහා පියවර ගෙන නොතිබුණි. තවද, 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර ව්‍යාපෘතියේ කාලසීමාව අවසානයට භාණ්ඩ සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.